ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016.10-03 |

පෙත්සම්කරුවන් - 01. නදී චන්ද්‍රසේකර මිය.
205/ඩී. දේවාල පාර.
රොබට් ගුණවර්ධන මාවත.
බත්තරමුල්ල.

02 එල්.එච්.ආර්.ටී. වීරසේකර මයා.
පාටපංගුව. හන්දුරුකන්ද.
පැල්මඩුල්ල.

03 කේ.ඩී. චන්ද්‍රසේකර මයා.
205/ඩී. දේවාල පාර.
රොබට් ගුණවර්ධන මාවත.
බත්තරමුල්ල.

වගඋත්තරකරුවන් - 01 සභාපති.
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.

02 අධ්‍යක්ෂ ජනරාල්.
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව.
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 07.

<u>පැමිණිලි අංක : HRC/2037/15, HRC/2038/15, HRC/1994/15</u>

ඉහත නම් සඳහන් පෙත්සම්කරුවන් විසින් තම පෙත්සම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කියා සිටින්නේ තම පෙත්සමේ දක්වා ඇති කරුණු පිළිබඳව සලකා බලා වගඋත්තරකරුවන්ට එරෙහි පරීක්ෂණ කටයුතු සිදු කර වගඋත්තරකරුවන් විසින්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 165,කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman — 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrc@sltnet.l
දුරකථන / தொலைபேசி — 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary — 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline — 011-2689558, 1996
වෙබ් / இணையம் / Web — www.hrcsl.lk

පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වූ බවට නිර්දේශයක් නිකුත් කරමින් ඉල්ලා ඇති සහන ලබා දෙන ලෙසද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වෙනත් සහනද ලබා දෙන ලෙසය.

ඒ අනුව පෙත්සම්කරුවන්ද වගඋත්තරකරුවන්ද වෙත පෙත්සම පිළිබඳව කරුණු දක්වා කරන ලද පරීක්ෂණ කටයුතු අවසන් කරමින් පෙත්සමේ සඳහන් කරුණුද වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම්ද දෙපාර්ශවයේ ලිඛිත දේශන හා ලිඛිත වාර්තාද පරීක්ෂණ අවස්ථා වලදී ඉදිරිපත් කළ කරුණුද සලකා බලා පහත සඳහන් අවසන් නිර්දේශය ඉදිරිපත් කරන ලදී.

පෙත්සම තුළින් දක්වා ඇති කරුණු :-

පෙත්සම්කරුවන් තිදෙනෙකු විසින් වගඋත්තරකරුවන්ට එරෙහිව පෙත්සම් තුනක් ගොනු කර ඇති අතර, HRC/2037/15 දරණ පෙත්සම ගොනු කළ නදිකා චන්ද්‍රසේකර මිය විසින් කියා සිටින්නේ පහත සඳහන් කරුණු වේ.

මෙම පෙත්සම්කාරිය තම රැකියාව ලෙස කලා කටයුතුවල යෙදෙන බවද රංගන ශිල්පිනියක් හා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරියක් බවද දක්වා ඇති අතර වසර 15 ක් පමණ වූ තම වෘත්තිය ජීවිතය තුළ ප්‍රධාන කඩඉමක් ලෙස දැක්විය හැක්කේ ටෙලි නාට්‍ය අධ්‍යක්ෂණයට පිවිසීම බව පෙන්වා දී ඇත. ඒ අනුව තම ප්‍රථම ටෙලි නාට්‍ය "ලා සඳ පාමුල" ලෙස අධ්‍යක්ෂණය කළ බවද එය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමග ඇති කර ගත් ගිවිසුමක් මත කටයුතු කරමින් විකාශනය කිරීමට කටයුතු කර තිබුණු බවද ප්‍රකාශ කර ඇත. ඒ අනුව 2014.10.30 දින සිට ටෙලි නාට්‍ය විකාශනය ආරම්භ කළ බවද ටෙලි නාට්‍යයේ මුළු කොටස් ප්‍රමාණයෙන් අඩක් පමණ විකාශනය වූ පසු ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් එහි විකාශන කටයුතු එක්වරම අත්හිටුවා තිබූ බවද දැනගත් පසු තමා විසින් ඒ පිළිබඳ වගඋත්තරකරුවන් වෙතින් විමසා සිටි බවද සඳහන් කර ඇත. නමුත් කරන ලද සියළු විමසීම් වලින් අනතුරුව තම අභියාචනා හා ඉල්ලීම් නොසලකා හැර අඩක් විකාශනය වූ ටෙලිනාට්‍ය තවදුරටත් ඉදිරියට විකාශනය කිරීම අත්හිටුවා ඇති බවද පෙන්වා දී ඇත.

වගඋත්තරකරුවන් වූ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් කරන ලද එකී ක්‍රියාව හේතු කොට ගෙන එනම් තමා විසින් අධ්‍යක්ෂණය කරන ලද තම ප්‍රථම ටෙලි නාට්‍ය විකාශනය කරමින් තිබියදී එක්වරම අත්හිටුවා තිබීම මත තමාවෘත්තිය ක්ෂේත්‍රය තුළ කතාබහට ලක්වන ආකාරයේ අකටයුත්තක් සිදු කර ඇති බවද, දැඩි ආර්ථිකමය හානියක් මෙන්ම තම රංගන ජීවිතය කෙරෙහිද විශාල අහිතකර බලපෑමක් ඉන් සිදුව ඇති බවද ප්‍රකාශ කර ඇත. වෙනත් ටෙලි නාට්‍ය විකාශනය වෙමින් තිබියදී තම ටෙලි නාට්‍යයට කරන ලද නොසලකා හැරීම හේතුවෙන්

අසාධාරණයක් සිදුව ඇති බවද මෙම ටෙලි නාට්‍ය නැවත විකාශනය සඳහා වෙනත් රූපවාහිනී නාලිකාවකට භාරදීමටද නොහැකි තත්වයක් ඇති වී තිබෙන බවද, මූල්‍යමය වශයෙන් විශාල හානියක් සිදුවූ බවද, බැංකු ණය ලබා ගනිමින් නිර්මාණය කළ ටෙලි නාට්‍ය විකාශනය එක්වරම අත්හිටුවා තිබීම මත බැංකු ණය පවා පියවා ගැනීම ගැටළුවක් වී ඇති බවද පෙන්වා දී ඇත. ඒ අනුව මෙම ටෙලි නාට්‍ය විකාශනය වෙමින් තිබියදී එහි විකාශනය එක්වරම අවසන් කිරීමට තීරණය කිරීම වගඋත්තරකරුවන් විසින් සිදුකර තිබීමෙන් විධායක හා පරිපාලන ක්‍රියාවක් මගින් කරන ලද නොසලකාහැරීමක් හේතුකොටගෙන 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව පෙන්වා දී ඇත.

HRC/3028/15 ලෙස තම පෙත්සම ගොනු කරමින් කේ.ඩී. චන්ද්‍රසේකර මහතා විසින් දන්වා ඇත්තේ, තමා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරයෙක් බවද, නදිකා චන්ද්‍රසේකර මිය අධ්‍යක්ෂණයෙන් දායක වී රංගන ශිල්පිනියක ලෙස කටයුතු කරන ලද "ලා සඳ පාමුල" නැමැති ටෙලි නාට්‍ය විකාශනය කිරීම වගඋත්තරකරුවන් සමග ඇති කර ගත් ගිවිසුමකට අනුව සිදුකළ බවදය. එය 2014 ඔක්තෝබර් මස 30 වන දින සිට 2015 පෙබරවාරි මස 20 වන දින හෝ ආසන්න දිනයක් වනතුරු විකාශනය කිරීමට එකඟව තිබුණද මුල් අවස්ථාවේ ගිවිසුමට අනුව විකාශනය කිරීමට තිබූ කොන්දේසි අතරමගදී වෙනස් කර විකාශන වේලාව පවා වෙනස් කර තිබූ බවද, ඒ අනුව විකාශනය කළයුතු ආකාරය වෙනස් කරමින් වගඋත්තරකරුවන්ට අවශ්‍ය පරිදි ක්‍රියා කළ බවද මේ වෙනුවෙන් ඇති කර ගත් ගිවිසුම කඩකිරීම එලෙස මුල් අවස්ථාවේදීම වගඋත්තරකරුවන් විසින් සිදු කළ බව පෙන්වා දී ඇත. තවද වගඋත්තරකරුවන් විසින් ඒකපාර්ශවීයව තීරණයක් ගනිමින් විකාශනය වෙමින් තිබූ ටෙලි නාට්‍යයේ විකාශන කටයුතු 2015.05.22 දින සිට අත්හිටුවන ලද බවද පෙත්සම තුලින් පෙන්වා දී ඇත. ඒ අනුව විශාල මුදලක් වැය කර නිෂ්පාදනය කළ ටෙලි නාට්‍ය වෙනුවෙන් ලැබිය යුතු මුදල් නොලැබී යාමෙන් හා කොටස් 60 කින් යුතු ටෙලි නාට්‍ය කොටස් 30 ක් හෝ ආසන්න ප්‍රමාණයක් පමණක් විකාශනය කර අත්හිටුවීම තුලින් තම කලා ජීවිතයටද ආර්ථිකයටද විශාල හානියක් සිදුව ඇති බවද ඒ පිලිබඳව වගඋත්තරකරුවන් වෙත කරන ලද අභියාචනා පවා නොසලකා හැර ඇති බවද දක්වා තිබේ. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් ගන්නා ලද විධායක හා පරිපාලන ක්‍රියාවන් තුලින් තමා නිෂ්පාදනය කළ ටෙලි නාට්‍ය විකාශනය වෙමින් තිබියදී විකාශනය අත්හිටුවීමට කටයුතු කර තිබීමෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව පෙන්වා දී තිබේ.

HRC/1994/15 ලෙස තම පෙත්සම ගොනු කළ එල්.එච්.ආර්.ටී. වීරසේකර මහතා විසින් දන්වා ඇත්තේ, තමා සහ තම පවුලේ අය ඉතාමත් විනෝදාස්වාදයකින් යුතුව නැරඹූ "ලා සඳ පාමුල" නම් ටෙලි නාට්‍ය අතරමැද නවතා දැමීම නිසා යම් කාලවකවානුවක් පුරා තම වටිනා කාලය වෙන්කර එකදිගට නැරඹූ ටෙලි නාට්‍යයක සම්පූර්ණ කතාංගයම නැරඹීමට නොහැකි වීමෙන් තම විනෝදාස්වාදාත්මක රසිකත්වයට වගඋත්තරකරුවන් හානි කර ඇති බවයි. ටෙලි නාට්‍ය

අවසානයේ කුමක් සිදුවේද යන්න මහත් කුතුහලයකින් යුතුව බලා සිටි බවද, ප්‍රේක්ෂක අයිතිවාසිකම් පිළිබඳ කිසිදු තැකීමක් නොමැතිව මෙම ටෙලි නාට්‍ය අත්හිටුවා තිබීම තුළින් අවසානයක් නොමැති ටෙලි නාට්‍යයක් නැරඹීමට වගඋත්තරකරුවන් විසින් ඔවුන්ව පොළඹවා දැඩි අසාධාරණයක් සිදු කළ බවද දක්වා ඇත. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් ගන්නා ලද විධායක හා පරිපාලන ක්‍රියාවන් තුළින් තමා මෙන්ම මෙම ටෙලි නාට්‍ය විකාශනය වීමේදී කරන ලද රසාස්වාදනය උල්ලංඝනය වී ඇති බවද එයට හේතු වී ඇත්තේ වගඋත්තරකරුවන්ගේ විධායක හා පරිපාලන ක්‍රියාවන් නිසි පරිදි සොයා බලා නිත්‍යානුකූල භාවයකින් යුතුව නොගැනීමෙන් බවද පෙන්වා දෙමින් වැඩිදුරටත් දක්වා ඇත්තේ වගඋත්තරකරුවන්ගේ එකී ක්‍රියාවන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බවය.

මෙම පෙත්සම්කරුවන් සියළු දෙනා විසින්ම ඉල්ලා ඇත්තේ, ටෙලි නාට්‍ය නැවත විකාශනය ආරම්භ කරන ලෙසය. විශේෂයෙන් පෙත්සම්කාර නදිකා චන්ද්‍රසේකර යන අය විසින් දන්වා ඇත්තේ, මෙම ටෙලි නාට්‍ය නැවත සම්පූර්ණයෙන් විකාශනය කිරීම සිදුකළයුතු බවද තමාට සිදුවූ මූල්‍යමය හානිය හා කීර්තිනාමයට සිදුකළ හානිය වෙනුවෙන් සාධාරණ ලෙස ඉල්ලා ඇති සහන ලබාදීමට කොමිෂන් සභාව විසින් වගඋත්තරකරුවන්ට නියම කරනු ලැබිය යුතු බවද වගඋත්තරකරුවන් විසින් තම මූලික අයිතිවාසිකම් කඩ කරමින් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබීම පිළිබඳ පරීක්ෂණය කර ඉල්ලා ඇති සහන සමග සුදුසු නිර්දේශයක් ලබා දෙන ලෙසය.

පැමිණිලිකරුවන්ගේ පැමිණිල්ලේ ඇති කරුණුද ඉල්ලා ඇති සහනද අතර නිසි සිවිල් අධිකරණයකින් විසඳා ගත යුතු කරුණු හැර වගඋත්තරකරුවන් විසින් කටයුතු කිරීමේදි 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂණය කර ඒ අනුව ලබා දිය හැකි සහන ලබා දීම සඳහා ද මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුව තිබේනම් එය තවදුරටත් වැළැක්වීම සඳහා ගත යුතු පියවර පිළිබඳ සලකා බැලීම සඳහාද කොමිෂන් සභාව විසින් පරීක්ෂණය ඉදිරි පියවරට සලකා බලන ලදි.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

2015.07.10 දින තම අංක රූවා/01 යටතේ තම වාර්තා වගඋත්තරකරුවන් විසින් පළමුවරට ලබාදී ඇත. ඒ අනුව දන්වා ඇත්තේ, රූපවාහිනී සංස්ථාව විසින් මෙම ඉහත කී පෙත්සම්කාර නදිකා චන්ද්‍රසේකර මහත්මිය සමග "ළා සඳ පාමුල" යන ටෙලි නාට්‍ය සඳහා ගිවිසුමක් අත්සන් කර තිබූ බවය. ගිවිසුමට අනුව ටෙලි නාට්‍යයේ එක කොටසක මිල රුපියල් එක් ලක්ෂ පනස් දහසක් බවද, කොටස් 60 ක් සඳහා රුපියල් ලක්ෂ 90 කට මිල නියම කර විකාශනය කිරීමට

ගිවිසුමට අනුව එකග වූ බවද විකාශනය ආරම්භ වී කොටස් පහෙන් පහට ගෙවීම් කරනු ලැබීම සිදු කල බවද දන්වා ඇත. ගිවිසුමේ එක් කොන්දේසියක් ලෙස ඇත්තේ ගිවිසුම් කාලයට පෙර ඕනෑම අවස්ථාවක හේතු ඉදිරිපත් කිරීමකින් තොරව ලිඛිත දැනුම්දීමකින් පසුව සංස්ථාවට ගිවිසුම අවසන් කිරීමේ හැකියාව ඇත යන කාරණාව වේ. තවද ටෙලි නාට්‍යයක් සම්බන්ධයෙන් පවතින ප්‍රතිචාර අවම මට්ටමක පවතී නම් හා ආදායම් තත්වය අවම මට්ටමක පවතී නම් සංස්ථාවට එම අවස්ථාවේදීම ගිවිසුම අවසන් කලහැකි බව දක්වා ඇත. ඒ අනුව 2014.10.30 වන දින සිට 2015.05.15 වන දින දක්වා කාලය තුල මෙම ටෙලි නාට්‍ය විකාශනය වූ කාලසීමාව වන රාත්‍රී 8.30–9.00 අතරවූ කාලපරාසය තුල මෙම ටෙලි නාට්‍ය වෙනත් නාලිකාවන්හි විකාශනය වූ ටෙලි නාට්‍ය හා සංසන්දනය කිරීමේදී අවම මට්ටමක පවතින බවද පෙන්වා දී තිබේ. මෙම නාට්‍ය විකාශනය කිරීමේදී දැන්වීම් මගින් ලැබූ ආදායමද අඩු මට්ටමක පැවති බව පෙන්වා දී ඇත. රූපවාහිනී සංස්ථාව භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපාදන නොලබන රාජ්‍ය ව්‍යවසායක් බවද සංස්ථාවේ වියදම් පියවා ගැනීමේදී ආදායම් උපයා ගැනීමට සිදුව ඇති බවද මෙම ටෙලි නාට්‍ය නැවත විකාශනය කිරීම තුලින් සංස්ථාවට දැඩි මුදල් අර්බුදයක් සිදුවන බවද යන කරුණු පෙනී ගිය බැවින් ගිවිසුම 2015.05.15 වන දින සිට දින 7 ක පූර්ව දැනුම්දීමකින් පසුව ගිවිසුමට අනුකූලව 2015.05.22 දින සිට ගිවිසුම අවසන් කලබව පෙත්සම්කාරියට දක්වා ඇති බවද කියා සිටී. තවද දින 7 ක පූර්ව දැනුම්දීමක් සිදු නොකර හේතු නොදක්වා ගිවිසුම අවසන් කලහැකි බව පෙත්සම්කරුවන් දන්නා බවද මෙම කාරණාව මුල් කර ගත් වෙනත් ටෙලි නාට්‍ය කීපයක්ද විකාශනය අත්හිටුවා ඇති බවද පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදු නොකල බවද වගඋත්තරකරුවන් වෙනුවෙන් එහි සභාපති ලෙස සිටි ආචාර්ය සෝමරත්න දිසානායක මහතා විසින් හා අනෙකුත් වගඋත්තරකරුවන් විසින්ද දක්වා ඇත.

2015.07.24 දින පළමු පරීක්ෂණය සඳහා දෙපාර්ශවය කැඳවා තිබූ අතර, පෙත්සම්කරුවන් වෙනුවෙන් නීතිඥ ධර්මසිරි කරුණාරත්න මහතා පෙනී සිට කරුණු ඉදිරිපත් කර ලදී.

වගඋත්තරකරුවන් වෙනුවෙන් වැඩසටහන් අංශයේ අංශ ප්‍රධානී විමලරත්න අධිකාරි මහතා සමග නීති අංශයේ සහකාර අධ්‍යක්ෂක එච්. සුදර්ශි චන්දිමා කුමාරි මිය ඉදිරිපත්ව කරුණු කියා සිටින ලදී.

පෙත්සම්කරුවන් විසින් තම පෙත්සමේ සඳහන් කරුණු වාචිකව ඉදිරිපත් කල පසු වැඩිදුරටත් කියා සිටින ලද්දේ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති (හිටපු) වන සෝමරත්න දිසානායක මහතා විසින් ද්වේශ සහගතව කටයුතු කරමින් හෝ වෙනත් පෞද්ගලික හේතු මත හෝ මෙම ටෙලි නාට්‍ය විකාශනය කිරීම අවසන් කර තිබීම ඒ සම්බන්ධව ඇති කර ගන්නා ලද කොන්දේසි උල්ලංඝනය කිරීකමක් බවද විකාශනය කිරීම ආරම්භ කරන ලද ටෙලිනාට්‍යයක විකාශනය අත්හිටුවීමට විධායක හා පරිපාලන තීරණ වගඋත්තරකරුවන් විසින් ගැනීමෙන් ද වෙනත්

ටෙලිනාට්‍ය විකාශනය කිරීම අඛණ්ඩව සිදුකිරීමෙන්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවද තියා සිටින ලදී.

මෙම පෙත්සමෙන් හා අමුණා ඇති වෙනත් ලේඛන අනුව රූපවාහිනී සංස්ථාවේ සභාපති විසින් ගන්නා ලද තනි තීරණයක් මත මෙම ටෙලි නාට්‍ය විකාශනය කිරීම අත්හිටුවා ඇති බවද එය ද්වේශ සහගතව ගන්නා ලද තීරණයක් මත සිදුකර ඇති බවද දක්වා තිබීම විශේෂ කාරණාවක් වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පරීක්ෂණ දින සඳහන් කරන ලද්දේ රූපවාහිනී සංස්ථාවේ සභාපති ලෙස කටයුතු කළ සෝමරත්න දිසානායක මහතා පරීක්ෂණ දින වනවිට විදේශ ගතව සිටි බවද සභාපති වෙනුවෙන් පෙනී සිටීමට පැමිණි නිලධාරීන් කටයුතු කළද සභාපතිගේ නමින්ම චෝදනා කරන කාරණාවක් බැවින් ඔහු ඉදිරිපත් කරවා ගනිමින් පරීක්ෂණය සිදු කිරීම සුදුසු බවය.

තවද ශ්‍රේෂ්ඨාධිකරණයේද අංක SCFR 281/15 යටතේ මෙම කාරණාව මූලික අයිතිවාසිකම් පෙත්සමක් මගින් මෙම පෙත්සම්කරුවන් විසින්ම ගොනු කර ඇති බවද, එකී නඩුවේදී කොමිෂන් සභාවේ විභාග වන පෙත්සම පිළිබඳව කරුණු දක්වා ඇති බවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගය කොමිෂන් සභාවේ පරීක්ෂණය පැවැත්වෙන බැවින් පෙත්සම්කරුවන් විසින් ඒ පිළිබඳ දක්වා සිටිමින් ඉදිරි දින ඉල්ලා ප්‍රමාද කර ඇති බවද දක්වා ඇත.

ටෙලි නාට්‍යයක් විකාශනය කිරීමේදී ඒ සඳහා නිෂ්පාදක වෙත කළයුතු ගෙවීම් සිදුකරන්නේ සේවා දායකයින්ගේ වෙළඳ දැන්වීම් වලින් ලැබෙන මුදල් වලින් බවද, දැන්වීම් ලබාදීමේදී ව්‍යාපාරිකයින් විසින් ටෙලි නාට්‍යයක ජනප්‍රියතාවය හා මහජන කැමැත්ත පිළිබඳව නිතර සොයා බලන බවද ටෙලිනාට්‍ය පිළිබඳව පර්යේෂණ සිදු කර වාර්තාගතව ඇති  දත්ත වාර්තාද අනුව ටෙලි නාට්‍යයේ ගුණාත්මක බවද සලකා බලන බවද වගඋත්තරකරුවන් විසින් පෙන්වා දෙන ලදී.

මෙම "ලා සඳ පාළුල" ටෙලි නාට්‍යය සඳහා ලැබූ ආදායම අඩු මට්ටමක තිබුණු බවද මහජන ප්‍රසාදය යහපත් මට්ටමක නොතිබුණු බවද පර්යේෂණ දත්ත අනුව අනාවරණය වූ පසු විකාශනය අත්හිටුවා ඇත්තේ ඒ සඳහා පත් කළ කමිටුවක් විසින් බවද වගඋත්තරකරුවන් විසින් පෙන්වා දෙන ලදී. එම කමිටුව සඳහා සංස්ථාවේ සභාපති ද, අධ්‍යක්ෂ ජනරාල් ද, අළෙවි අංශයේ අධ්‍යක්ෂක ද, ප්‍රධාන ගණකාධිකාරී හා නීති නිලධාරී ද වැඩ සටහන් අංශ ප්‍රධානී හා පරිපාලන අධ්‍යක්ෂක ද කමිටු ලේකම් හා චිත්‍රපට හා හඬකැවීම් අංශයේ අධ්‍යක්ෂක ද ඉදිරිපත් වන බව පෙන්වා දී ඇත.  වගඋත්තරකරුවන්ගේ වාර්තාවට අනුව වැඩිදුර කරුණු දැක්වීම සඳහා පැමිණිලි පාර්ශවය වෙත අවස්ථාව ලබා දෙමින් පරීක්ෂණය ඉදිරි දිනයකට කල් තබන ලදී.

2015.08.14 වන දින පරීක්ෂණ අවස්ථාවේදී පෙත්සම්කරුවන් විසින් වාචිකව ඉදිරිපත් කරන ලද කරුණු වලට අමතරව HRC/1944/15 දරණ ගොනුවේ පෙත්සම්කරු ද ඉදිරිපත්ව කරුණු කියා සිටින ලදී. ඒ අනුව මෙම ටෙලිනාට්‍ය නැරඹූ රසිකයකු ලෙස තම මූලික අයිතිවාසිකම් කඩවීමට අදාලව මෙම පෙත්සම ගොනු කරන ලද්දේ මුල් අවස්ථාවේ සිට ටෙලිනාට්‍ය විකාශනය අත්හිටවූ දින දක්වා දැඩි කැමැත්තකින් නරඹන ලද ටෙලිනාට්‍යක් බවද අතරමැද ටෙලිනාට්‍ය නතරකර තිබීමෙන් මෙම ටෙලිනාටයේ අවසානය දක්වා කතාව විකාශය කුමන ආකාරයකට සිදුවේද යන්න පිළිබඳව කුතුහලයකින් හා ඉමහත් ආශ්වාදයකින් යුතුව නැරඹීමෙන් ලද විනෝදාස්වාදය වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවයි.

පෙත්සමේදී ඉදිරිපත් කරන ලද කරුණු හා වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද කරුණුද සලකා බලා යම් සමථයක් සඳහා කටයුතු කළ හැකිද යන්න පිළිබඳව විමසා සිටි අතර. එය ලිඛිතව ලබාදුන් පසු සලකා බැලිය හැකි බවට කරුණු දක්වන ලදී.

ඒ අතරතුර වගඋත්තරකරුවන් විසින් එවන ලද වැඩිදුර වාර්තාවේ සඳහන් කරුණු පහත පරිදි වේ.

පෙත්සම්කරුවන් හා වගඋත්තරකරුවන් අතර "ළා සඳ පාමුල" ටෙලිනාට්‍ය සඳහා ගිවිසුමක් අත්සන් කළ බවද එහි එකී ටෙලිනාට්‍ය සඳහා එක් කොටසකට මිල රුපියල් එක්ලක්ෂ පනස්දාහක් බැගින් සම්පූර්ණ කොටස් 60 ක් වූ මුලු ටෙලිනාට්‍ය සඳහාම රුපියල් ලක්ෂ 90ක් ගෙවීමට මිල නියම කර තිබූ බැවින්ද. ඕනෑම අවස්ථාවක ගිවිසුම අත්හිටුවීමේ පරමබලය වගඋත්තරකරුවන් සතුව ඇති බවටද ලිඛිතව ගිවිසුමේ දක්වා තිබුණු බවද පෙන්වා දී ඇත. තවද මෙම ටෙලිනාට්‍ය විකාශනය කිරීමේදී දැන්වීම් තුලින් උපයාගත් ආදායම සහ ප්‍රේක්ෂක ප්‍රතිචාර අඩු මට්ටමක පැවතිම මත සංස්ථාව පත්ව තිබූ දැඩි මූල්‍ය අර්බුදකාරි තත්ත්වයන් යටතේ තවදුරටත් විකාශනය කිරීම ගැටළුවක් වන බැවින් විකාශන කටයුතු අත්හිටුවන ලද බවද දන්වා ඇත.

පෙත්සම්කරුවන් කැඳවා මෙකී ටෙලිනාට්‍ය නැවත විකාශනය කිරීම සඳහා ඇතිකර ගත හැකි සමථයක් වෙනුවෙන් සාකච්ඡා කර වාර්තාවක් ලබා දෙන ලෙසට 2015.08.14 වන දින කොමිෂන් සභාව විසින් ලිඛිතව වගඋත්තරකරුවන් වෙත දන්වා යවන ලදී. ඒ අනුව 2015.08.26 වන දින පෙත්සම්කරුවන් කැඳවා සමථයක් සඳහා සාකච්ඡා කිරීමට පියවර ගන්නා ලද බව කොමිෂන් සභාවට වාර්තා කර ඇත. ඒ අතරතුර පෙත්සම්කරුවන් විසින් සමථයකට එළඹීම සඳහා වාචිකව දක්වන ලද වගඋත්තරකරුවන්ගේ කොන්දේසි පිළිබඳව එකගතාවයක්ට පත්විය නොහැකි බවට කියා සිටිමින් ලිඛිතව සමථ කොන්දේසි ලේඛනයක් මගින් ඉදිරිපත් කරමින් සමථයකට එළඹීමට නම් පෙත්සම්කරුවන් ඉල්ලා සිටින සහන හා කොන්දේසිවලට අනුව සහන හිමිවිය යුතු බවද දක්වා ඇත.

ඒ අනුව පෙත්සම්කරුවන් ඉල්ලා සිටින සමථයන් හා එකගතාවයන් වී ඇත්තේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මෙම පෙත්සම විභාගවෙමින් තිබියදී පෙත්සම්කරුවන්ගේ තවත් ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ SCFR/282/15 යටතේ විභාග වෙමින් පවතින බැවින් හා ඒ පිළිබඳ වගඋත්තරකරුවන්ද ඒ බව මෙම කොමිෂන් සභාව වෙතද දන්වා ඇති බැවින් බැවින්ද, ශ්‍රේෂ්ඨාධිකරණයේ එකී නඩුවේ කටයුතු වලදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ද මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කරන ලද පෙත්සමක් විභාග වන බව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ කරුණු අනුව දන්නා බැවින්ද එකී නඩුවේ ඉල්ලා ඇති අයිතිවාසිකම් වලට අගතියක් නොවන පරිදි සමථයක් සිදු විය යුතු බවට මූලිකව දන්වා ඇත.

තවද රූපවාහිණී සංස්ථාව සමග ඇති කර ගන්නා ලද ගිවිසුම්ගත එකගතාවයට අනුව ටෙලිනාට්‍ය විකාශනය කළයුතු බවද පෙත්සම්කරුවන්ට සිදු වී ඇති හානිය වන රුපියල් ලක්ෂ 80 ක මුදල පියවා ගැනීම සඳහා සුදුසු පරිදි ගෙවීම් කටයුතු සිදු කරමින් තම කීර්තිනාමයට හා රංගන වෘත්තියට සිදු වූ අවමානය වෙනුවෙන් සාධාරණ විකාශන වේලාවක් තුළ ඉදිරි තම ටෙලිනාට්‍ය නිෂ්පාදනයන් වසර 10ක් යනතුරු වාර්ෂිකව එක් ටෙලිනාට්‍ය බැගින් විකාශනය කිරීමට මූලිකත්වය දියයුතු බවටද වූ කොන් දේසි සමථ කොන්දේසි ලෙස පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුවන් විසින් දන්වා ඇත්තේ පෙත්සම්කරුවන් විසින් යෝජනා කරන ලද සමථයට එකග නොවන බවද. සමථයක් ලෙස වගඋත්තරකාර සංස්ථාව විසින් කියා සිටින්නේ ටෙලිනාට්‍ය ඉතිරි කොටස් ප්‍රමාණය කොටස් 28 දක්වා සංස්කරණය කළ යුතු බවටද ගිවිසුම්ගත මුදලට වඩා අඩු මුදලකට විකාශනය වීමට කැමැතිනම් සලකා බැලිය හැකි බවදය. ඒ බව 2015.09.22 වන දින පවත්වන ලද අවසන් පරීක්ෂණයේදී ද වගඋත්තරකරුවන් විසින් කියා ඇති අතර එවැනි ආකාරයකට පමණක් සමථයකට එළඹිය හැකි බව වගඋත්තරකරුවන්ගේ අදහස වී ඇත. පෙත්සම්කරුවන් එකී සමථයට එකග නොවන බව ද සමථය තුළින් යෝජනා කර සිටින කරුණු ද මෙම ටෙලි නාට්‍ය විකාශනයට එකගව අත්සන් තබන ලද ගිවිසුමට පටහැනි බව පෙන්වා දෙමින් වැඩිදුරටත් දන්වා ඇත්තේ, සමථ කොන්දේසි තුළින්ද වගඋත්තරකරුවන් තවදුරටත් මූලික අයිතිවාසිකම් කඩතරවන ආකාරයේ යෝජනාවක් ඉදිරිපත් කරන බවයි. ඒ අනුව සමථයක ආකාරයෙන් පෙත්සම අවසන් කර ගැනීමට නොහැකි වන්නේ වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සමථ යෝජනා හා පෙත්සම්කරුවන් ඉදිරිපත් කරන ලද සමථ යෝජනා එකිනෙකට පරස්පර වීම හේතුවෙනි.

**නිරීක්ෂණ :-**

පෙත්සම්කරුවන් විසින් ගොනු කරන ලද පෙත්සමේ සඳහන් කරුණු හා වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාද දෙපාර්ශවය ඉදිරිපත් කළ සියලුම ලේඛනද පරීක්ෂණ

අවස්ථාවේදී අනාවරණය කර ගන්නා ලද කරුණු ද වෙත අවධානය යොමු කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වී ඇත.

පෙත්සම්කාර නදීකා චන්ද්‍රසේකර මිය වෘත්තිමය වශයෙන් රංගන ශිල්පිනියක ලෙස කටයුතු කරන බවද 2003 වසරේදී හොඳම ටෙලිනාට්‍ය නවක නිලිය සම්මානයෙන්ද 2007 වසරේදී හොඳම සහය නිලිය සම්මානයෙන්ද 2005 වසරේදී විශිෂ්ඨම සහය නිලියට හිමි සම්මානයෙන්ද සම්මාන ලබා ගත් රංගන ශිල්පිනියක් බවද පෙත්සමට අනුව අනාවරණය වේ.

ඇය විසින් අධ්‍යක්ෂනය කරන ලද "ලා සඳ පාමුල" ටෙලිනාට්‍ය ඇයගේ ප්‍රථම ටෙලිනාට්‍ය අධ්‍යක්ෂනය බවද පෙනී යයි. කේ.ඩී. චන්ද්‍රසේකර මහතා පෙත්සම්කරුවකු ලෙස ඉදිරිපත් වන්නේ එකී ටෙලිනාටයේ නිෂ්පාදක ඔහු වන බැවිනි. මෙම ටෙලිනාට්‍ය නිෂ්පාදනය කළ පසු ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව විසින් එහි විකාශන කටයුතු සඳහා ගිවිසුමකට එළඹ ඇති අතර. එකී ගිවිසුමට අනුව මෙම ටෙලිනාට්‍ය විකාශනය සිදුව නොතිබීම මෙම පෙත්සම ගොනු කිරීමට හේතු වී ඇති බව අනාවරණය වේ.

ගිවිසුමට අනුව මෙම ටෙලිනාට්‍ය ආරම්භ කළ දින සිට සතියේ දින 04ක් රාත්‍රි 8.30ට විකාශනය සිදු කළ යුතුය. නමුත් විකාශනය ආරම්භ වී කෙටි කලක් තුළදී ගිවිසුමේ කොන්දෙසි කඩකරමින් විකාශනය දින 04ක් සිදු නොකර සිකුරාදා රාත්‍රි 8.30ට පමණක් විකාශනය සිදුකර ඇති බවද පෙනී යයි. පසුව මෙම ටෙලිනාට්‍ය විකාශනය වන වේලාව නියමිත වේලාවට නොව සංස්ථාව විසින් තීරණය කරන ලද වේලාවක විකාශනය කරවීම තුළින් පෙත්සම්කරුවන්ට මූලිකවම යම් අසාධාරණයක් සිදුවීමේ ආරම්භයක් සිදුව ඇති බව පැහැදිලි වේ. පසුව මෙම ටෙලිනාට්‍ය විකාශනය වීම සම්පූර්ණයෙන්ම අත්හිටුවා තිබී ඇති අතර, එම හේතුව මත තම මූලික අයිතිවාසිකම් කඩ වූ බවට පෙත්සම්කරුවන් විසින් කරුණු දක්වා මුල් අවස්ථාවේදීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතද පසුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙතද තම කරුණු පෙත්සමක් මගින් ඉදිරිපත් කර ඇත.

ටෙලිනාට්‍ය විකාශනය වන කාලය තුළ මාසිකව රුපියල් ලක්ෂ 15ක් ලබා දීමටද වගඋත්තරකරුවන් එකඟව ඇති අතර, ගිවිසුමේ ඇති එකී එකගතාවයට පටහැනි ලෙස ගෙවීම කටයුතු නිසි දිනට ගෙවා නැති බවද පෙත්සම්කරුවන්ගේ ලිඛිත දේශන පරීක්ෂා කිරීමේදී අනාවරණය වේ. තම ටෙලිනාට්‍යට වෙන්කළ ගුවන් කාලය තුළ වෙනත් ටෙලිනාට්‍ය දෙකක් විකාශනය වීම සඳහා රූපවාහිණි සංස්ථාව විසින් ගිවිසුම් අත්සන් කර ඇති බව පෙත්සම්කරුවන් විසින් පෙන්වා දී ඇති අතර. එය තම ටෙලි නාට්‍යට වෙන් කළ කාලය බවද සාධාරණ වූ හේතු මත නොවන කාරණා ඉදිරිපත් කරමින් පෙත්සම්කරුවන්ගේ ටෙලිනාට්‍යයේ විකාශනය අත්හිටුවා එකී කාලය වෙනත් ටෙලි නාට්‍ය සඳහා ලබා දී සිදුකර ඇත්තේ සාධාරණ

නොවූ ක්‍රියාවක් බවට පෙන්වා දෙන කරුණු අනුව එය වගඋත්තරකාර පාර්ශවයේ පරිපාලනය හා විධායකය විසින් මූලික අයිතිවාසිකම් කඩ කරමින් ගන්නා ලද ක්‍රියාමාර්ගයක්ද යන්න පිළිබඳව සොයා බැලීම වැදගත්ය. ඒ අනුව වගඋත්තරකරුවන් මෙතෙක් පෙන්වා දී ඇති සියළු කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ මෙම ටෙලිනාට්‍ය විකාශනය කිරීම සඳහා ගිවිස ගන්නා ලද ගිවිසුමෙහි ඇති නියමයන් අනුව ඕනෑම අවස්ථාවක ටෙලිනාට්‍ය විකාශනය කිරීම අත්හිටුවීමට වගඋත්තරකරුවන් සතුව ඇති බලය භාවිතා කරමින් එය සිදුකර ඇති බවද ඒ සඳහා වැඩිමනත් හේතුවක් ලෙස ටෙලිනාට්‍යයට ලැබී ඇති ප්‍රේක්ෂක ප්‍රතිචාර අවම මට්ටමක පැවැතීමද ආදායම ප්‍රමාණවත් පරිදි නොලැබීමද හේතුවක් බව දක්වා ඇත. නමුත් ඒ පිළිබඳව කිසිම අවස්ථාවක පැමිණිලිකරුවන්ට දක්වා නොමැති අතර එක්වරම ටෙලිනාට්‍යයේ විකාශනය අත්හිටුවා තිබීම හඳුනාගත හැක. පැමිණිලිකරුවන්ට ඒ බව දක්වා සවන් දීමේ අවස්ථාවක් හෝ ගත හැකි වෙනත් පියවරක් සඳහා කටයුතු කිරීමට විමසීමක් සිදු නොකිරීමෙන් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය වී ඇති අතර ගන්නා ලද තීරණයන් ගිවිසුමට අනුව ගත් බව කීවද ගිවිසුමක් තුලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාපිත මූලික අයිතිවාසිකම් පිළිබඳ නියමයන් නොසලකා හැර සිටිය නොහැකි බව පෙන්වා දිය යුතුය.

ටෙලිනාට්‍ය විකාශනය වීම අත්හිටුවා තිබීම මත මෙම ටෙලිනාට්‍යයේ කටයුතු කළ තවත් කලා ශිල්පීන් බොහෝ පිරිසක් අසාධාරණයකට ලක් වී ඇති බවට ද පෙත්සම්කරුවන් විසින් කරුණු හේතු සහිතව පෙන්වා දී ඇති අතර, පෙත්සම්කරුවන් හට නියමිත වර්ෂවලදී විකාශනය වූ ටෙලිනාට්‍ය උදෙසා පවත්වනු ලබන වාර්ෂික සම්මාන පිරිනැමීමේ උත්සව සඳහා ඉදිරිපත් වීමට තිබූ අවස්ථාවද මින් උල්ලංඝනය වී ඇති බව අනාවරණය වේ.

වගඋත්තරකරුවන් විසින් මෙම ටෙලිනාට්‍ය විකාශනය වීම අත්හිටුවීම සඳහා ගිවිසුමේ සඳහන් නියමයන් මුල් කරගත් බව පෙන්වා දුන්නද ගිවිසුමේ සඳහන් නියමයන් එසේ උල්ලංඝනය කිරීම කොතෙක් දුරට සාධාරණද යන්න කලා ශිල්පීන්ගේ වෘත්තීන් කෙරෙහි වන බලපෑම හා සම්බන්ධව සලකා බැලීමේදී සිතිය යුතු වේ. මෙම ටෙලිනාට්‍ය විකාශනයට අදාළව ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව වගඋත්තරකරුවන්ගේ ප්‍රධාන කොන්දේසි දෙකක් වෙත අවධානය යොමු කිරීම වැදගත් වේ. එනම් "ගිවිසුම් කාලයට පෙර ඕනෑම අවස්ථාවක හේතු ඉදිරිපත් කරමින් ලිඛිත දැනුම්දීමකින් පසුව සංස්ථාවට ගිවිසුම අවසන් කිරීමේ හැකියාව ඇත" යන්නය. එය ගිවිසුම තුළ ඉංග්‍රීසි භාෂාවෙන් දක්වා ඇත්තේ The Corporation Shall be entitled to terminate this Agreement prior to the expiration of the period of this agreement on giving Seven (07) days written notice without signing any reason to the Producer ලෙසය.

තවද වගඋත්තරකරුවන් විසින් ගිවිසුම අවලංගු කිරීමට හේතු කර ගන්නා ලද දෙවන කොන්දේසිය ලෙස පෙන්වා දී ඇත්තේ, "ටෙලිනාට්‍ය සඳහා වූ මහජන ප්‍රතිචාර අවම මට්ටමක

පවතින්නේ නම් හා අදායම් තත්ත්වය අවම මට්ටමක පවතින්නේ නම්" බවට වේ. සංස්ථාවට එම අවස්ථාවේදී ගිවිසුම අවලංගු කිරීමේ හැකියාව ඇත යන්න දක්වා ඇත. එය ගිවිසුමට අනුව ඇත්තේ "The Corporation shall be entitled to terminate this Agreement with immediate effect after the 30th Episode in the event that teledrama does not sustain a minimum rating of 6,and fails to gain revenue to the time belt" ලෙසය.

ඒ අනුව 2014.10.30 වන දින සිට 2015.05.15 දින දක්වා කාලය තුළ රාත්‍රී 8.30 – 9.00 අතර විකාශනය වූ ටෙලිනාට්‍ය වෙනත් නාලිකාවන් හි ප්‍රචාරනය වූ ටෙලිනාට්‍ය සමග සන්සන්දනය කිරීමේදී ප්‍රේක්ෂක ප්‍රතිචාරය අවම මට්ටමක පැවති බවද ආදායම අඩු මට්ටමක තිබූ බවද සැලකිල්ලට ගන්නා ලද්දේ කෙසේද යන්න විමසා සිටින විට එය පෞද්ගලික සමීක්ෂණ සමාගමක් වූ එල් එම් ආර් බී නම් ආයතනය මගින් ලබා ගත් සමීක්ෂණ දත්ත මත පදනම් කර ගත් බවද වගඋත්තරකරුවන් කියා සිටීම වෙත අවධානය යොමු කරන ලදී. සමීක්ෂණ ආයතනයක් විසින් ඉදිරිපත් කළ සමීක්ෂණයක වාර්තාවක් මතම පදනම්ව ටෙලිනාට්‍ය විකාශනය අවසන් කිරීමට තීරණය කිරීම සාධාරණ එකක් නොවන බව පෙන්වා දිය යුතුය. ටෙලිනාට්‍ය නරඹන ලක්ෂ සංඛ්‍යාත පිරිසක් වෙනුවෙන් තෝරා ගත් නිවාස 500 ක් පමණක් නියැදියක් ලෙස තෝරා ගනිමින් සමීක්ෂණ කටයුතු සිදු කරන ආයතනයක එකී පවුල් 500 ක් විසින් ලබාදුන් දත්ත පමණක් හා ටෙලිනාට්‍ය වෙත ලැබෙන දැන්වීම් මගින් වූ අදායම ප්‍රමාණවත් නොවීම යන්න විකශනය වෙමින් පවතින ටෙලිනාට්‍යයක විකාශනය අත්හිටුවීටම සුදුසු එකක් නොවන බව පෙන්වා දිය යුතුය. මෙම ටෙලි නාට්‍ය නරඹන්නන් අතරින් සාධාරණ වූ රසික ප්‍රතිශතයක් මෙම සමීක්ෂණයට හසු කර ගන්නා ලද බව ඔප්පු කිරීම එකී සමීක්ෂණ වාර්තා අනුව කිමට වගඋත්තරකරුවන් අපොහොසත් වී ඇති බවද පෙන්වා දිය යුතුය.

මූල්‍යමය හානියක් සංස්ථාවට සිදු වන්නේ මෙම ටෙලිනාට්‍ය විකාශනය වීම හේතු කර ගෙනම බව තහවුරු නොවන අතර, විකාශන වන වැඩසටහන් සියල්ලම එක්ව ගෙන හා වෙනත් සියලු කාරණා සම්බන්ධව සාධාරණ වූ සමීක්ෂණයක් සිදු කර සංස්ථාව මූල්‍ය අර්බුදයකට පත්ව ඇත්තේ කුමන හේතූන් මතද යන්න පිළිබඳ සොයා බැලීම වඩාත් සුදුසු බවද ඒ පිළිබඳව නිසි අධ්‍යයනයක් කිරීමකින් තොරව පෞද්ගලික සමීක්ෂණ ආයතනයක් වෙතින් ලබාගත් කුඩා නියැදියක් පදනම් කර ගනිමින් මිලියන ගණනක් වැය කර නිෂ්පාදනය කරන ලද ටෙලිනාට්‍යක විකාශනය එක්වරම අත්හිටුවීම යුක්තිසහගත හා සාධාරණ එකක් නොවන බව පෙන්වා දිය යුතුය. සංස්ථාව මූල්‍ය අර්බුදයකට පත්ව ඇතිබව කියා තිබීම අනුව එය කුමන හේතූන් මත සිදුව ඇද්ද යන්න පිළිබඳව කරුණු අනාවරණය කර ගැනීමට පියවර නොගෙන පෙත්සම්කරුවන්ගේ ටෙලිනාට්‍ය විකාශනය කිරීම අත්හිටුවීමට කටයුතු කර තිබීම සුදුසු එකක් නොවන බව පෙන්වා දිය යුතුය. එසේම, මෙම ටෙලි නාට්‍යය සංස්ථාවේ අදාළ නිලධාරින්/විශේෂඥයන් විසින් නරඹා අනුමැතිය දී තිබීමද වැදගත් වේ.

1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියම පිළිබඳ පනතේ (Unfair Contract Terms ACT No.26 of 1997) හි ප්‍රතිපාදන මෙම ගිවිසුම කෙරෙහි කොතෙක් දුරට බලපෑමක් සිදු කරන්නේ ද යන්න පිළිබඳ අවධානය යොමු කරන ලදී. ඒ අනුව ගිවිසුම් කඩකිරීම හෝ නොසැලකිලිමත්කම හෝ වෙනත් යුතුකම් කඩකිරීම සඳහා වූ සිවිල් වගකීම ගිවිසුම් නියමයන් මගින් හෝ අන්‍යාකාරයකින් මගහැරිය හැකි ප්‍රමාණය මත සීමා පැනවීම සඳහා පනවා ඇති බවද මෙම පනත තුළින් පෙන්වා දෙන කරුණු මෙම ගිවිසුම කෙරෙහි බලපෑමක් කරන්නේ කෙසේද යන්න පිළිබඳවද අවධානය යොමු කරන ලදී. මෙම පනතේ 4 (අ) අනුව ගිවිසුම කඩකරන තැනැත්තා ඔහුම වනවිට ඒ කඩ කිරීම සම්බන්ධයෙන් ඔහුගේ යම් වගකීමක් බැහැර කිරීම හෝ සීමා කිරීම කළනොහැකිය යන්න පෙන්වා දෙන අතර, එකී වගන්තියේ (ආ) (1) අනුව ගිවිසුම යටතේ ඔහුගෙන් යුක්ති සහගත ලෙස අපේක්ෂිත ගිවිසුම්ගත ඉටු කිරීම් වලට සාරානුකූලව වෙනස් ගිවිසුම් ගත ඉටු කිරීම් වලට හැකියාවක් නොමැති බව පෙන්වා දී ඇත. තවද එකී වගන්තියේ (ආ) (2) අනුව ඔහුගේ සම්පූර්ණ ගිවිසුම්ගත බැඳීම හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් කිසිදු ඉටු කිරීමක් නොකර සිටීමට තමා හිමිකම් ලබන්නේ යැයි කියා සිටිය නොහැකි බව පෙන්වා දී ඇත. ඒ අනුව සලකා බැලීමේදී කොතෙක් දුරට වගඋත්තරකරුවන් විසින් පෙත්සම්කරුවන් සමග ඇති කර ගන්නා ලද ගිවිසුම සාධාරණද යන්න පිළිබඳවද ගැටළුවක් මතු වේ.

මුල් අවස්ථාවේදීම ගිවිසුමට අනුව ඇති කර ගන්නා ලද මෙම ටෙලිනාට්‍ය විකාශනය කිරීමේ ගිවිසුම් ගත වේලාව තුළ විකාශනය නොකිරීමෙන් ගිවිසුමේ නියමයන් කඩ කරනු ලබන්නේ ද වගඋත්තරකරුවන් විසින්ම බව නිරීක්ෂණය වේ. ටෙලි නාට්‍ය විකාශනය වීමට පෙර ප්‍රචාරය කරන ලද දැන්වීම් අනුව ප්‍රේක්ෂකයා විසින් නියමිත වේලාවේ ටෙලිනාට්‍ය නැරඹීමට හුරුපුරුදු වූ පසු එකී ටෙලි නාට්‍යයේ වේලාව වෙනස් කර විකාශනය කළපසු ප්‍රේක්ෂකයා අපහසුතාවයකට පත්වන අතර බොහෝ විට එවැනි ටෙලි නාට්‍යයක් නැවත නැරඹීමට ඔවුන්ට ඇති අවස්ථාව අහිමි වීමට ද ඉඩ ඇති අතර. නැවත නැරඹීම සඳහා රසිකත්වයක් ඇතිවිය නොහැකි බවද පෙන්වා දිය යුතුය. තවද සතියට දින 4 ක් විකාශනය කිරීමට එකගව තිබූ ටෙලි නාට්‍ය සතියට එක් දිනක් පමණක් ලෙස විකාශන කාලය හා දින වෙනස් කරන්නේ ද වගඋත්තරකරුවන් විසින්ම වන බවද නිරීක්ෂණය වේ. ගිවිසුමට අනුව බැලූවද එම පරිපාලන තීරණයන් ගිවිසුම තුළින් ඇති කර ගන්නා ලද කොන්දේසි උල්ලංඝනය කරන්නක් වේ.

තවද මෙවැනිම ආකාරයකට ටෙලිනාට්‍ය විකාශනය වීම හා සම්බන්ධ ඇති වූ කාරණාවක් මූල්කර ගනිමින් මූලික අයිතිවාසිකම් කඩ කිරීමේ සිදුවීමක් සම්බන්ධව කරුණු දක්වා ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන ලද නඩු කරයක් වූ <u>බෙනට් රත්නායක එදිරිව ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව හා තවත් අය</u> නඩුවේදී "මකරවිජිතය" නම් වූ ටෙලිනාට්‍යයේ විකාශනය හා සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීරණය වැදගත් එකක් බවට පෙන්වා දිය යුතුය. එහිදී

විකාශන කාලය හා ටෙලිනාට්‍ය විකාශනය කාලය තීරණය කිරීම සම්බන්ධව වගඋත්තරකරුවන් විසින් තම අභිමතය පරිදි කටයුතු කිරීම වරදක් බවද ගුවන් කාලය යනු මහජන දේපලක් (Public Property) බවද පෙන්වා දී ඇත. එහිදී එකී ටෙලි නාට්‍ය විකාශනය අත්හිටුවීම සම්බන්ධව ගන්නා ලද තම ක්‍රියාකලාපයන්ට එරෙහිව රූපවාහිණී සංස්ථාව විසින් එහි පෙත්සම්කරුට මුදලින් වන්දි ගෙවිය යුතු බවටද එකී ටෙලිනාට්‍ය සම්බන්ධවද නිෂ්පාදකගේ වෙනත් ටෙලිනාට්‍ය විකාශනය කිරීම සම්බන්ධවද කරුණු දක්වා දෙන ලද නියෝගය මෙම පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම කෙරෙහිද හා කරුණු දැක්වීම කෙරෙහිද බලපාන්නාවූ සමාන වූ නීතිමය තත්ත්වයන් දක්වා වගඋත්තරකරුවන්ට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරුණු දක්වා ඇති තඩු කරයක් බව පෙන්වාදිය යුතුය.

නිගමනය :-

වගඋත්තරකරුවන් විසින් තම පරිපාලන හා විධායක ක්‍රියාවන් මත කටයුතු කරමින් ගන්නා ලද තීරණ මත පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩවූ බවට කියා සිටිමින් ගොනු කරන ලද මෙම පෙත්සමේ කරුණු තහවුරු වී ඇති බව දන්වා සිටිමු. ඇති කර ගන්නා ලද ගිවිසුම උල්ලංඝනය කිරීම සඳහා කටයුතු කර ඇත්තේ වගඋත්තරකරුවන් විසින් පරිපාලනමය වශයෙන් ගන්නා ලද තීරණ බව අනාවරණය වේ. විකාශනය වන ටෙලි නාට්‍යයක විකාශනය අවසන් කිරීමේ ඒකායන පරම බලය වගඋත්තරකරුවන් විසින් තමන් වෙත තබා ගෙන ඇති බවද අනාවරණය වේ.

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ අත්තනෝමතික විධායක හා පරිපාලන ක්‍රියාවන් හේතුවෙන් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සිදුව ඇති බවද ඉන් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවද කොමිෂන් සභාවේ නිගමනය වේ.

නිර්දේශය :-

ඒ අනුව පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු බවට වගඋත්තරකරුවන්ට මෙයින් දන්වා සිටිනු ලැබේ.

01 "ලා සඳ පාමුල" ටෙලිනාට්‍ය නැවත ගිවිසුම්ගත නියමන්ට අනුව සම්පූර්ණයෙන්ම මුල සිට සියළුම කොටස් විකාශනය කළයුතු බවද,

02 මෙම ටෙලිනාට්‍ය විකාශනය කඩිනමින් ගිවිසුමේ සඳහන් විකාශන කාලය තුළ සිදු කළ යුතු බවද,

03 මෙම ටෙලිනාට්‍ය වෙනුවෙන් කළයුතු ගෙවීම් ගිවිසුමට අනුව වියයුතු බවද මෙතෙක් ගෙවන ලද කොටස් ප්‍රමාණයට කළ ගෙවීම් පෙත්සම්කරුට ගෙවා ඇති බැවින් විකශනය වන ඉතිරි කොටස් විකාශනය සිදුවීම ආරම්භ වූ අවස්ථාවේ සිට ඉදිරියට ගෙවීම් සිදුකළ යුතු බවද

04 මෙම පෙත්සම්කරුවන්ගේ රංගනයෙන් හෝ නිෂ්පාදනයෙන් හෝ අධ්‍යක්ෂණයෙන් යුතුව ඉදිරිපත් කරනු ලබන වෙනත් ටෙලිනාට්‍ය රූපවාහිනී සංස්ථාව වෙත ඉදිරියේදී විකශනය සඳහා ලබාදුන් පසු වෙනස්කමකට හෝ නොසලකා හැරීමකට භාජනය නොකල යුතු බවද වේ.

2016-01 30 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

B/